# මගේ ලෝකය

## ඇසෙන දැනෙන දේ..
## හිතට වැදෙන දේ..



ජගත් ජේ එදිරිසිංහ

*Accept no one's definition of your life; define yourself.*
**Harvey Fierstein**

### පසු ගිය කලාපය හා බැඳෙයි

ඇල් ඩී ඒ රත්නායක නම් මහතකු විසින් 1947 දී ලියන ලද ''සංගීත ඉතිහාසය'' හා ''ටවර් හෝල් නාට්‍ය ඉතිහාසය'' නම් පොත් දෙකෙහි සිංහල නූර්ති ඉතිහාසයේ නම රැන්දූ ගුණාතිලක පරම්පරාවේ නාට්‍ය ඉතිහාසය සඳහන් වෙයි. මේ පරම්පරාවේ නූර්ති ආරම්භ වන්නේ දොන් විලියම් විජේසිංහ ගුණාතිලක මහතා ගෙනි. අලුත්ගම මාලවනකන්ද වත්තේ වලව්වේ දොන් පිලිප් විජේසිංහ ගුණාතිලක මුහන්දිරම් තුමා ගේ පුතා ලෙස 1847 දී උපත ලැබුවේ ය. 1907 දී ජන්මාන්තර ගත වූ දොන් විලියම් විජේසිංහ ගුණාතිලක මහතා ද සිය පියා අනුව යමින් නූර්ති කලාවට අතගැසුවේය. කොළඹ ආදුරුප්පු වීදියේ ගෑස් ආලෝකයෙන් නිමකළ රඟමඬලේ දී නූර්ති රඟ දැක් වූ ඔහු සිය නූර්ති දිවයිනේ විවිධ පළාත් වලට ගෙන ගියේ ය කොළඹ ආදුරුප්පු වීදියේ ගෑස් ආලෝකයෙන් නිමකළ රඟමඬලේ දී රඟ දැක්වූයේ ය.

ඔහුගේ පුතා ඩී ජේ ඩබ්ලිව් ගුණාතිලක නම් විය. උපන්නේ ක්‍රිව 1872 දී ය. පසු කළෙක විස්මකර්ම ගුරුන්නාන්සේ ලෙස ප්‍රකට වූයේ ඔහු ය. ඔහු පිළිබඳව ඇල් ඩී ඊ රත්නායකයන් සිය ''ටවර්හෝල් නාටක ඉතිහාසය'' නම් පොතෙහි ලියා ඇත්තේ මෙසේ ය.

''මේ බහුශ්‍රැත නාට්‍ය කතුවරයා උපන්නේ 1872 දීය. අලුත්ගම මාලවනකන්ද වත්තේ දොන් පිලිප් විජේසිංංහ ගුණාතිලක මුහන්දිරම් මහතාගේ මුණුපුරෙක් වූ ඩී ජේ ඩබ්ලිව් ගුණාතිලක වූ කලී පැරැණි නාඩගමත් එම සංගීත වාද්‍ය හා වේදිකා සැකසුම් ආදියත් නව නැම්මකින් ඉදිරියට ගෙන ආ එහි පුරෝගාමියා වේ. එසේම මොහුගේ පියා වූ දොන් විලියම් විජේසිංහ ගුණාතිලක මහතා ද පැරැණි නාඩගම් ගත්කරුවෙකි. (මෙකී ගුණාතිලක පිය පුතු දෙදෙන එදවස නාඩගම් කරලියෙහි යෙදී සිට කරන ලද දස්කම් සියල්ලම අපගේ ''සිංහළ නාඩගම් සාහිත්‍ය - ඉතිහාසය'' නමැති ග්‍රන්ථයෙන් දක්නට ලැබේ. සී දොන් බස්තියන් හා නීතිඥ ජෝන් ද සිල්වා යන වියතුන් ඇසුරෙන් නාට්‍ය රචකයෙක් වූ ඩී ජේ ඩබ්ලිව් ගුණාතිලක විදේශීය රටවල් කීපයකම ඇවිද විවිධ ජාතික නාට්‍ය සංගීත කලා ශාස්ත්‍ර හා අද්භූතාත්මක විස්කම් දේවල්ද ඉගෙණ සංදර්ශනයන්හි යොදා දැක්වීමෙන් කිත් පැසසුම් ලැබුවෙක් ය. ළමා කල්හි සිය ගමෙහි පාසැලෙන් හා කොළඹට විත් සිය පියාගේ වෙළඳ කටයුතු වල යෙදෙමින් ම පිරුවෙන් අධ්‍යාපනයද ලැබගත් ගුණාතිලක සංහළ පාලි සංස්කෘත භාෂා කීපයක්ද දත්තෙකි. 1952 දී ටවර් හෝල් හි ආර්ය සිංහල නාට්‍ය සභාවේ සභාපති පදවිත් දරා සිටියදී මේ උසස් නාට්‍ය කතුවරයා හදිසියේම මිය ගියේ ය. ගුණාතිලක ලියුවේ නාට්‍ය ග්‍රන්ථ 11 කි.

1 උත්තර රාම චරිතය (1909)
2 මුතු කුමාරි චරිතය (1909)
3 ලංකා මාතා හෙවත් ජාති දුක්ඛ ප්‍රකරණය (1918)
4 අභිනව දුෂ්චරිත භංග ප්‍රකරණය (1919)
5 චන්දන කුසුමා නාට්‍යය (1918)
6 සාම ජාතක නාට්‍යය (1919)
7 මහෞෂධ කුමාර චරිතය (1920)
8 අශෝකමාලා චරිතය (1920)
9 චූලර්ණ නාට්‍යය (1928)
10 මහා පදරංග ජාතක නාට්‍යය (1928)
11 මහා භාරත නාට්‍යය (1929)

මේ කෘතින්ට වඩා තවත් නාට්‍යය ලියන්නට ගුණාතිලකට නොහැකි වූයේ ඔහුට නාඩගම් රචනා කිරීම සඳහා තම



ඩී ජේ ඩබ්ලිව් ගුණාතිලක - විස්මකර්ම ගුරුන්නාන්සේ

කාලයෙන් වැඩි හරියක් යොදවන්නට සිදුවූ හෙයිනි.''

''හෙතෙම ලිවූ පෙරකී නාට්‍ය කෘතින් පිළිබඳ සංක්ෂිප්ත විස්තරයකි මේ.

**1 උත්තරාම චරිතය (1909)**
සංස්කෘත උත්තර රාමයෙහි එන මේ කථාව අංක ජවනිකාවනට නොබෙදාම කතුවරයා සින්දු (34) කවි හා පද වාසගම් (15) වලින් නිමකර සංගීත නාට්‍යයක් ලෙසින් දක්වයි. ''තෙළිගු හා භාරත'' නාට්‍ය සම්ප්‍රදායික සැලැස්මක ගෙතුණු මේ නාට්‍යයෙහි සින්දු වල රාග තාලත් කතෘගේම ය. බී ජේ පෙරේරාගේ ''පැවිලියන්'' හි හා ''ටවර්හෝල්'' හි නාට්‍ය සංගම් මගින් (1910 - 1913) මේ කාලය තුළදී 210 වාරයක් පමණ දක්වා ඇති මේ නාට්‍යය කර්තෘ විසින් පසු කාලයේදී නාඩගම් සම්ප්‍රදාය අනුව ගොතා ප්‍රදර්ශනය කරන ලදින් එය පිටු 16 ක පොතක් වශයෙන් මුද්‍රිතකර ඇත.

**2 මුතුකුමාරි චරිතය (1909)**
කතුවරයා මෙය කළෙත් ඔහුගේ උත්තරාරාම චරිතය මෙන් මෙහි කථාවද සින්දු කවි පදවාසගම් වලින් නිමවන සංගීත නාට්‍යයක් ලෙසිනි. එදවස ජනකවි පොතක් වශයෙන් මුද්‍රණයෙන් පළව තිබූ 'මුතු කුමාරිගේ කථාව' වනාහි ප්‍රංශ සාහිත්‍යයෙහි එන්නකි. පැරිසියෙහි හැන්රි - වෙරෝනා - නේරංග - අස්නීසන් යනාදී කුමරුන් සත් දෙනට ටැබර්නි රට රජුගේ - ඍදානේ - ගර්ලිනා යනාදී දූ කුමරියන් සත් දෙන සරණ බැඳ දීමේ මංගල්‍යයේදී වූ ගැටුමකින් සිත් කලකිරුණු ඇස්නීසන් කුමර තෙමේ තම සිතැඟි පරිදි වන වැදී එම අරුම පුදුම වූ මුතු කුමරිය සොයාගෙන සිය රටට එන ගමනේදී සිදුවූ වියවුල් විපත් සියල්ලම මේ නාටකයෙන් පෙන්නුම් කෙරෙයි. කතුවරයා මේ කථාවද පසුකාලයෙහි නාඩගම් ග්‍රන්ථයක් වශයෙන් මුද්‍රණයෙන් පළකර ඇත.

**3 ශ්‍රී ලංකා මාතා හෙවත් ජාති දුක්ඛ ප්‍රකරණය (1918)**
අංක 8 ජවනිකා 35 සින්දු 35 හා වාසගම් 290 කින්ද යුක්ත වේ. මේ නාටකයෙහි ඇති සින්දු සියල්ලම කතුවරයා දැන උගත් උර්දු හින්දු ද්‍රවිඩ රාග තාල අනුවම පබඳින ලද ඒවා ය. සිංහල නාටක ඉතිහාසයෙහි සඳහන් සමාජ නාටක අතරින් - බුදුරජුන් වදාළ ''පටිච්ච සමුප්පාද ධර්මය'' අනුව මිනිස්

*මෙහි පළමු දර්ශන දෙක 1918 දී ටවර්හෝල් හි දක්වන ලද අවස්ථාවේදී එය නැරඹනුවස් එහි පැමිණ සිටි දහස් ගණන් මහජන සභා මධ්‍යයෙහි වූ නීතිඥ ජෝන් ද සිල්වා හා සී දොන් බස්තියන් යනාදී වියතුන් ඇතුළු පුවත්පත් කතුවරුන් විසින් ද - මෙහි අගය වන මින් මෙම නාට්‍ය සභාව හිමි සිරිවර්ධන හා ගුණාතිලක යන මහතුන්ට ද තුති පැසසුම් කරමින් කළ කථාවන් පිළිබඳ විස්තරයක් කිරීමට මෙහි ඉඩක් නොමැත.*

දිවිය වැළි කෙලියේ පටන් මරු සයනය දක්වා - අවුරුදු දශකයෙන් දශකයට වෙනස් වන ස්වභාවය ද - විවිධ චරිත කෙරෙන් විදහා දැක්වනු ලබන්නාවූ එකම එකම සමාජ නාටකය මෙය වේ. සිංහල සිරිත් හා සම්බුදු දහමද අමතක කර දුසිරිතට නැමී අදමිටු දිවියක් ගත කළ ''වික්ටර් සිල්වා - කර්ලැයින් '' යනා දීන්ට වූ විපත්තීන් බුදු දහම පරිදි ගුණ දහම් රැක සිටි - ''සිරිමාන්න හා සෙනෙහෙලතා'' නම් යුවල අවසානයේ දොලොව සැපතට පත් වූ සැටිත් මෙම කථාවේ සාරය වේ. පී සී සිරිවර්ධනගේ ''ශ්‍රී ලංකා මාතා නාට්‍ය සභාව'' මගින් මෙහි පළමු දර්ශන දෙක 1918 දී ටවර්හෝල් හි දක්වන ලද අවස්ථාවේදී එය නැරඹනුවස් එහි පැමිණ සිටි දහස් ගණන් මහජන සභා මධ්‍යයෙහි වූ නීතිඥ ජෝන් ද සිල්වා හා සී දොන් බස්තියන් යනාදී වියතුන් ඇතුළු පුවත්පත් කතුවරුන් විසින් ද - මෙහි අගය වන මින් මෙම නාට්‍ය සභාව හිමි සිරිවර්ධන හා ගුණාතිලක යන මහතුන්ට ද තුති පැසසුම් කරමින් කළ කථාවන් පිළිබඳ විස්තරයක් කිරීමට මෙහි ඉඩක් නොමැත.
342 වාරයක් දක්වා තිබෙන මෙම නාටකය පී සී සිරිවර්ධන විසින් 1922 දී පිටු 40ක පොතක් වශයෙන් කොළඹ පිටකොටුවේ 5ස් වැනි හරස් වීදියේ ග්‍රන්ථාලංකාර යන්ත්‍රාලයේ මුද්‍රණය කර බෙදාහරින ලදී.

**4 අභිනව දුෂ්චරිත භංග ප්‍රකරණය (1919)**

අංක (3) ජවනිකා (26) සින්දු (28) හා වාසගම් 264 කින් ද නිමවන මේ නාටකයේ සින්දු වල රාග තාලත් කර්තෘගේමය. එදා සිංහලයා තුළ වූ පරගැති කම් හා දුසුරිත් වලට මෙයින් පහර වැදේ. මේ නාටකයද 1919 දී මුද්‍රණය කර බෙදා හැරිය බැව් මෙහි කතුවරයා දිනක් අප සමග කීය.

**5 චන්දන කුසුමා නාට්‍යය (1918)**

කතුවරයා පෙරදී කවි පොකත් වශයෙන් පළකර තිබූ චන්දන කුසුමා නැමැති පතිදම්රැකි ආදර්ශමත් ඉන්දීය කුමරියකගේ කථාවකි- මෙහි එන්නේ. අංක (2) ජවනිකා (18) සින්දු (27) හා වාසගම් (145) කින් නිමවන මෙහි සින්දු වල රාගතාල සංගීතඥ කේ ඩී ජෝර්ජ් ජයරත්න ගේ ය. මෙයද 28 වාරයක් පමණ දක්වා තිබේ.

**6 සාම ජාතක නාට්‍යය (1919)**
අංක (2) ජවනිකා (19) සින්දු (28) හා වසගම් (172) කින් ද නිමවන මෙහි සින්දු වල රාග තාලත් කර්තෘගේම ය. මහබෝසත් තුමා සාම කුමරුව ඉපිද තම අන්ද මව්පියන් රැකි අයුරු මෙහි කථා සාරය වේ. 58 වාරයක් මෙයද වේදිකා ගතකර තිබේ.

**7 මහෞෂධ කුමාර චරිතය (1920)**
අංක (3) ජවනිකා (21) සින්දු (33) හා වසගම් (273) කින් ද යුක්ත වේ.... 15 වාරයක් පමණ පෙන්වා තිබේ. මේ නාටකටය් සින්දු පමණක්ඇතුළත් කර එය පොතක් වශයෙන් මුද්‍රණය කර

21 වන පිටට